## වෂර් 2022 ක්වූ ජනවාරි මස 25 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.Gගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05..S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12.A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14.D.M දීසායු මංජුල දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17.A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

| | |
|---|---|
| 24.තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 25.කුමාරවේලු කනගරත්නම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 26.H.G සුසිලාවති මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 27.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 28.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 29.K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 30.සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 31.R චමිලා ෆොන්සේකා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 32.H.G සුභද්‍රා සමරනායක මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 33.K සුප්පයියා ජීවා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 34.පිච්චෙයි සෙල්වපූනේස්වරි මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 35.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 36.ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 37.චාමික රුවන් දසනායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

| | |
|---|---|
| 38. M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 39. A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 40. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 41.M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 42. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 43. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

පසුගිය දෙසැම්බර් මස 24 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පසුගිය දෙසැම්බර් මස 24 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙසට මම යෝජනා කරමි.

ගරු ගයානි ශ්‍රියාමාලා  මන්ත්‍රීතුමිය

පසුගිය දෙසැම්බර් මස 24 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා**

පසුගිය දෙසැම්බර් මස 24 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී* අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.

*ඒ අනුව* සභා වාර්තාව *ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

2.1.අපිට කුමන ප්‍රශ්න තිබුනත් මෙම වසර කිහිපය තුළ උඩපළාත ජනතාවට විශාල සේවාවක් ඉටු කිරීමට හැකි වූ බවත් එහිදී අපට අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයත් ගරු අමාත්‍ය මණ්ඩලය,ගරු මන්ත්‍රීවරු ඇතුළු අනෙකුත් සියළු දෙනාගේද සහයෝගය ඒ සදහා ලැබුණු බවත් උඩපළාතේ ගරු මහ සභාවෙන් ලද සහයෝගය මත බල ප්‍රදේශයේ ජනතාවට විශාල වැඩ කොටසක් කල බවත් ඒ පිළිබඳව තමා සභාපති ලෙස සතුටු වන බවත් අපට පෙබරවාරි මාසයේ මහ සභාව විසුරුවා හැරීමට තිබු නමුත් රජයේ විෂයභාර අමාත්‍යතුමා විසින් තවත් වසරකින් පළාත් පාලන ආයතන වල කාලය දීඝර් කර ඇති නිසා තවත් වසරක් ජනතාවට සේවය කිරීමට අවස්ථාව ලද බවත් ඒ සම්බන්ධව තමා මෙන්ම ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළුම දෙනා සතුටු වනු ඇති බවත් සදහන් කරන ලදි.

2.2.ගරු වෙරපිටිය මන්ත්‍රීතුමා අසනීප වී ඇති බවත් එතුමා ශල්‍යකමර්යකට භාජනය වීම සදහා රෝහල් ගත වී ඇති බවත් ඒ සම්බන්ධව දන්වා ලිපියක් එවා ඇති බවත් සදහන් කරමින් එතුමාට ඉක්මන් සුවය ප්‍රාථර්නා කරමින් එතුමාට ගරු කිරීමක් ලෙස ඒ සම්බන්ධයෙන් වූ නිවේදනය සභා ගත කරන ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න - නොමැති බව සදහන් කරන ලදි.

5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (1)

5 **(1.1)** ගබඩා ඉන්වෙන්ට්‍රි ලේඛන සංශෝධනය කිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

ගබඩා ඉන්වෙන්ට්‍රි ලේඛන සංශෝධනය කිරීම වෙනුවෙන් ගෙන ආ යෝජනාව අවසානයේ ශේෂය දැනගැනීමේ කාරණාවේදී ගැටළුවක් වන නිසා එය නිවැරදි කරගැනීම පිණිස ගබඩා ඉන්වෙන්ට්‍රි ලේඛන සංශෝධනය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5 (1.2) 2022 වෂර්ය සදහා ටෙන්ඩර් ඉදිරිපත් නොවූ කඩ කාමර නැවත ටෙන්ඩර් කිරිම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

පසුගිය වර ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදි තමාද ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයෙකුව සිටි බවත් ටෙන්ඩර් කිහිපයක් ඉදිරිපත් නොවී තිබු බවත් ඉල්ලුම් නොකර තිබූ බවත් දොළුව වෙළඳ සංකීණර්යේ කඩ කාමර 2 ක් දොළුව ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට ලබාදුන් බවත් අනෙක් කඩ කාමර දහයෙන් නවයක්ම ටෙන්ඩර් මඟින් ලබාගෙන ඇති බවත් දොළුව වෙළඳ සංකීණර්ය නවීකරණය කිරීමේ යෝජනාව තමා විසින් ගෙන ආ බවත් එහි ආදායම අද සභාවට ලැබෙන බවත් මෙය අයවැයේදී අපට ලබාදෙන ප්‍රතිපාදන මුදල් වැඩි කර ගැනීමට ආයෝජනයක් වු බවත් දොළුව කඩ කාමර ලබාගැනිමට ගැණුම්කරුවන් සිටින බවත් එම අය නිතර ඒ පිළිබඳව විමසන බවත් නාරංවිට පොල් එලදාවේ ටෙන්ඩර් එකේ මුදල පිළිබඳව ගැටළුවක් පවතින බවත් මෙය කුඩා මුදලකට ලබාදෙන බවත් අද වෙළඳපොලෙහි පොල් ගෙඩියක මිල සම්බන්ධයෙන් බලන කල ටෙන්ඩර් කරන මුදල ප්‍රමාණවත් නොවන බවත් ඒ නිසා මෙම නාරංවිට පොල් එලදාව සම්බන්ධ තක්සේරු මුදල වැඩි කර ලබාදෙනවා නම් ඉතා වටිනා බවත් එයින් සභාවට ලැබෙන ආදායම වැඩි වන බවත් ඒ නිසා මේ සමබන්ධව අවධානය යොමු කරන ලෙසත් මෙහි පොල් ගස් 21ක් තිබෙන බවත් සදහන් කරමින් 2022 වෂර්ය සදහා ටෙන්ඩර් ඉදිරිපත් නොවූ කඩ කාමර නැවත ටෙන්ඩර් කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (3)

5 (1.3) බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරිමේ ව්‍යාපෘතිය සදහා පහත පරිදි තාක්ෂණ ඇගයිම් කමිටු පත්කිරිම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

01.සභාපති - ටී.එම්.පී.සී.ඒකනායක මහතා
පළාත් පාලන ඉංජිනේරු,පළාත් පාලන දෙපාතර්මේන්තුව,
මධ්‍යම පළාත

02.සාමාජික - ඩබ්.එම්.ජී.කේ.ආර්.බණ්ඩාර මහතා
ගණකාධිකාරි, පළාත් පාලන දෙපාතර්මේන්තුව,මධ්‍යම පළාත

03. සාමාජික - උදය පරණගම්පොල මහතා
ඉංජිනේරු,ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු හා පයෙර්ෂණ සංවිධානය

04. සාමාජික - සී.වික්‍රමසිංහ මහතා

තාක්ෂණ නිළධාරි, උඩපළාත ප්‍රාදේශීය සභාව,දැල්පිටිය,

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මෙය තමාගේ යෝජනාවකට අනුව ක්‍රියාත්මක වීමට නියමිත බවත් සභාවට ආදායමක් ලැබෙන ව්‍යාපෘතියක් ලෙස බුම්මලේ ආදාහනාගාරය සැලකිය හැකි බවත් දොළුව ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම් 33ක් ඇතුළත් වන බවත් එපමණක් නොව ගඟවටකෝරලේ ප්‍රදේශයට ආසන්නව පවතින බවත් මෙහි දුම් පිටවීමද ගැටළුවක් නොවන බවත් ඒ නිසා මෙය පසුගිය සභාවේදී අපි කථා කරගෙන ආ බවත් සභා කාලය වසරකින් දීඝර් වීම පිළිබඳව තමා සතුටු වන්නේ මෙවන් කටයුතු ඉටු කිරීමට හැකි වන නිසා බවත් අපිට සියළු මන්ත්‍රී මණ්ඩලයේ නාමය පවතින යෝජනාවක් ලෙස ආදාහනාගාරය ඉදිකිරීම සිදු කරන බවත් එහි සමරු ඵලකයේ අපේ සියළු ගරු මන්ත්‍රී මණ්ඩලයේ නම් ඇතුළත් වන බවත් මෙම කටයුතු සඳහා ලේකම්තුමිය විශාල උනන්දුවකින් ක්‍රියා කරන බවත් තවද ප්‍රාදේශීය ලේකම්තුමියද මේ සඳහා අපට සහයෝගය ලබාදෙන බවත් ප්‍රදේශයේ මරණාධාර සමිති 4ක් පවතින බවත් ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් භූමිය ලබාදීම පිළිබඳව සතුටු වන බවත් මෙහිදි අපි කලින් තීරණය කල පරිදි ආදාහනාගාරය හලියද්දේ ඉදිකිරීමට තීරණය වුවත් එහි ජනතාවට ආදාහනාගාරයේ දුම යන නිසා අකමැති වූ බවත් ඒ නිසා බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව විරෝධතාවය නොදැක්වීම ගැන බුම්මලේ ප්‍රදේශයේ ජනතාවට විශාල ස්තූතියක් පුද කරන බවත් එසේම ඉදිරි මාස කිහිපය ඇතුළත තමා දේශපාලනයෙන් තොරව උත්සවයක් සංවිධානය කිරීමේ වගකීම භාරගන්නා බවත් සියළු මන්ත්‍රීවරුන්ට එම අයගේ ගෞරවය ලැබෙන පරිදි කටයුතු කිරීමේ වගකීම තමා භාරගන්නා බවත් සඳහන් කරමින් බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරිමේ ව්‍යාපෘතිය සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු පත්කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා</u>

තමා මෙම යෝජනාව පිළිබඳව කණගාටු වන බවත් අපේ උප සභාපතිතුමා මෙම යෝජනාව ගෙන ආ නමුත් තමා මෙම යෝජනාව මීට වසර කීපයකට ඉහතදී සභාවට ඉදිරිපත් කල බවත් එහිදි ගරු චම්පික රණවක ඇමතිතුමා මුදල් ප්‍රතිපාදන වෙන් කරන බව සඳහන් කර තිබූ බවත් තමා ආදාහනාගාරය සෑදීමට යෝජනා කලේ ප්‍රදේශයේ ජනගහණය ගැන සලකමින් බවත් පුපුරුස්ස,ලෙවලන්,අප්ලන්ඩ්,හේවාහැට දක්වාම ආදාහනාගාරයක් නොමැති බවත් අපේ සභාවේ මුදල් වලින් වැඩ කරන විට සභාවට ආදායමක් ලැබෙන පරිදි මුදල් වෙන් කල යුතු බවත් තමාගේ ප්‍රදේශයට පමණක් වැඩ කරනවා යන කාරණය තමා නොදකින බවත් කොස්සින්න,ගම්පොල,පුස්සැල්ලාව ආදාහනාගාර තිබෙන නමුත් යෝජනා සම්මත වී ඇත්නම් කමක් නැති බවත් මීට වසර ගණනාවකට පෙර ඉඩම් කොටසක් වෙන් කර කටයුතු සූදානම් කර තිබියදීත් මෙවැනි ප්‍රදේශයක ආදාහනාගාරයක් ඉදිකිරිමට කටයුතු කිරීම සම්බන්ධයෙන් සභාවේ ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙස තමාගේ බලවත් කණගාටුව හා අකමැත්ත ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු පාඨලී චම්පික ඇමතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ආදාහනාගාරයක් ඉදිකරන බව සඳහන් කල නමුත් එය ඉටු නොවූ බවත් මෙය තමාගේ තනි තීරණයක් නොවන බවත් සාකච්ඡා කර ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් කටයුතු කල බවත් ඉඩම් වෙන් කර කථා කර ගත් තීරණයක් බවත් මෙම ආදාහනාගාරය දොළුවේ සෑදුවාට කිසිවෙකුට ප්‍රශ්නයක් නොවන බවත් අපේ ප්‍රදේශයේද අවමංගල අවස්ථා වලදි පුස්සැල්ලාව ආදාහනාගාරයට මෘතදේහ රැගෙන යන බවත් ඔබතුමාගේ අදහස් සම්බන්ධයෙන් තමාද කණගාටු වන බවත් නමුත් දොළුවේ ආදාහනාගාරය ඉදි කිරිමේදී හිදගල දක්වාම ආවරණය වන බවත් ඒ නිසා අපි ප්‍රශ්න වලට නොගොස් සුහදව කටයුතු කරමු යැයිද ගරු ජයපති මන්ත්‍රීතුමා පළමුව යෝජනා කලමුත් එය ඉටු නොවූ බවත් දෙවනුව බුම්මලේ සෑදීමට යෝජනා වූ බවත් ඒ සඳහා කවුරුන් හෝ විරුද්ධ වනවාදැයි විමසන ලදි.

ගරු ඩබ්.ප්‍රේමතිලක මන්ත්‍රීතුමා

ගරු ජයපති මන්ත්‍රීතුමා එදා ගෙන ආ යෝජනාව තමා ස්ථිර කල බවත් එතුමා පල්ලේදෙල්තොට කොට්ඨාශයේ ඉඩම් වෙන් කර සියළු කටයුතු අවසන් බව සභාවේදී ප්‍රකාශ කල බවත් එහිදි අප සතුටු වූ බවත් පාතහේවාහැට බල ප්‍රදේශය තුළ මෙන්ම ගඟවට කෝරළයේද ආදාහනාගාරයක් නොමැති බවත් නමුත් අපි මධ්‍යස්ථානයක් වශයෙන් පල්ලේදෙල්තොට කොට්ඨාශය සුදුසු බවට යෝජනා ගෙන ආ නමුත් බුම්මලේ දැනට යෝජනා කල ස්ථානය බලන විට ගම්පොල ආදාහනාගාරයට ඉතා ආසන්න බවත් කොස්සින්නේද ආදාහනාගාරයක් පවතින බවත් මෙහිදි අසාධාරණයක් වන්නේ පල්ලේ දෙල්තොට, හිඳගල,මොරහේන,තුම්පැලවක ප්‍රදේශ වලට ආදාහනාගාරයක් නොමැති නිසා පැය දෙකක පමණ කාලයක් ගත කර විශාල දුරක් ගෙවා ගෙන යා යුතු වන නිසා හැකියාවක් ඇත්නම් සභාවේ අනුමැතිය ලබාගෙන ගරු ජයපති මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි පල්ලේදෙල්තොට ආදාහනාගාරයක් ඉදිකිරීමට කටයුතු කිරීම වඩා වැදගත් බව සඳහන් කරන ලදි.

ගරු කීතර්‍රී රත්නායක මන්ත්‍රීතුමා

මෙම යෝජනා වලින් එකක් ගරු ජයපති මන්ත්‍රීතුමා ගෙන ආ බවත් එහිදි ගරු පාඨලී ඇමතිතුමාගෙන් මුදල් ලබාගෙන පල්ලේදෙල්තොට ආදාහනාගාරයක් ඉදිකිරීමට සභාවට යෝජනා කල බවත් අනෙක් යෝජනාව වන්නේ ගරු උප සභාපතිතුමා දොළුව බුම්මලේ ආදාහනාගාරයක් ඉදිකිරීමට ගෙන ආ යෝජනාව බවත් ගරු උප සභාපතිතුමා අයවැය යෝජනා වලදී මෙන්ම යම් යම් කමිටු රැස්වීම් වලදි මේ සම්බන්ධයෙන් යෝජනා කර හඩක් නැගූ බවත් සභා අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලෙස ගිය වසරේද පෙර වෂර් වලද ගරු උප සභාපතිතුමා ඉල්ලීම් කල බවත් එම යෝජනාව සම්මත වි ඇති බවත් ගරු පාඨලී චම්පික ඇමතිතුමාගෙන් මුදල් ප්‍රතිපාදන වෙන් වි තිබුණා නම් එම යෝජනාව අපට ක්‍රියාත්මක කර ගැනීමට තිබූ බවත් ගරු ජයපි මන්ත්‍රීතුමා කෙතරම් මහන්සි වී ඉඩම් වෙන් කර ගත්තත් මුදල් ප්‍රතිපාදන නොලැබුණ බවත් මෙවන් වැඩ කටයුතු රාශියක් ඉටු කිරීමට යෝජනා වී ති නමුත් ආණ්ඩු පෙරළිය සමඟ අපට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් බුම්මලේ ප්‍රදේශයට ආදාහනාගාරයක් අවශ්‍ය බවට දිවංගත අග්‍රාමාත්‍යතුමාගේද මෙම අදහස තිබූ බවත් ඒ අනුව ගරු උප සභාපතිතුමා මෙම ප්‍රදේශය නියෝජනය කරන නිසා ජනතාවගේ ඉල්ලීම අනුව මෙම යෝජනාව ගෙන ආ බවත් ඉඩම් වෙන් කරගැනීම ආදි යම් යම් අවස්ථා වලදී තමාද එම ස්ථාන වලට ගිය බවත් උඩපළාතේ ජනතාවට කෙසේ හෝ සේවයක් වනවා නම් අපි සතුටු විය යුතු බවත් හේවාහැට දුෂ්කර ප්‍රදේශයක් නිසා එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කල යුතු බවත් එම ප්‍රදේශයේ නායකයින් ඒ සම්බන්ධයෙන් කටයුතු කල යුතු බවත් ගරු කිරිඇල්ල ඇමතිතුමාගේ ප්‍රතිපාදන මත පුස්සැල්ලාව ආදාහනාගාරය ඉදි කල බවත් සඳහන් කරමින් බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරීම කාලෝචිත බව සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පුස්සැල්ලාව ආදාහනාගාරය බවුන්ඩ්‍රියේ ඉදිකල බවත් එය ඉදිකලේ වතු යටිතල පහසුකම් යටතේ වතුවල ජනතාව වෙනුවෙන් බවත් මෙය අපි ඉදි කල ආදාහනාගාරයක් නොවන බවත් අපි නිතරම උඩපළාතේ ජනතාවට සේවාවක් වන කටයුතු ඉටු කලයුතු බවත් අනෙකුත් අය සේවා ලබාගැනීමට පැමිණෙනවා නම් ගැටළුවක් නොමැති බවත් නමුත් උඩපළාතේ ජනතාවගේ මුදල් වලින් මූලික වශයෙන් උඩපළාතේ ජනතාවටම සේවාවක් ලබාදීමට කටයුතු කල යුතු බවත් අපේ බල ප්‍රදේශයට මධ්‍යස්ථව තිබෙන්නේ දොළුව නිසා මේ සඳහා අනුමැතිය ලබාගත් බවත් ඒ නිසා අපි ඉඩම් මැන කටයුතු ඉටු කර අවසන් නිසා මෙම කටයුත්ත ඉටු කර ඉදිරියේදී වෙනත් ස්ථානයක් බලා කටයුතු කරමු යැයිද සඳහන් කරන ලදි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

තාක්ෂණික කමිටුව පිළිගැනීම සුදුසුද නැද්ද යන්න පමණක් සභාවෙන් විමසූ බවත් නමුත් දැන් ස්ථානය පිළිබඳව විවාදයකට ගිය බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව පිළිබඳව ගෙන ආ යෝජනාව ස්ථිර වූ බවත් නගර සභාව හා කොස්සින්න ආදාහනාගාර ගැන කථා කල නමුත් අපි අපේ සභාවේ ආදායම වැඩි කර ගෙන අපේ ජනතාවට වඩා වටිනා සේවාවක් ලබාදීමට කටයුතු කර ගෙන යා යුතු බවත් පළමු කාරණය ලෙස ගරු ජයපති මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉටු වූවා නම් හොද බවත් දෙවන කාරණාව ලෙස සභා අරමුදල් වලින් බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරිමට යෝජනා වූ බවත් එහිදී කහවත්ත, ලැඟුම්දෙණිය, පන්විලතැන්න,තුංදෙණිය,වැවතැන්න,ගම්පොලවත්ත,නිල්ලඹ,වාරියගල, කළුගමුව ආදී ප්‍රදේශ සම්බන්ධ වන ස්ථානයක් ලෙස බුම්මලේ ඉදිකිරීම වඩා ඵලදායී බවත් භූමිය,පිහිටීම,ගමන් පහසුව යන කාරණා අනුව බුම්මලේ වඩා යෝග්‍ය බවත් සදහන් කරමින් බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා අපි සියළු දෙනාගේ සහයෝගය ලබා දෙමු යැයි ඉල්ලීමක් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

බුම්මලේ ආදාහනාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ තාක්ෂණික සේවා කමිටුව සභාව පිළිගෙන ඇති බවත් කෙසේ නමුත් තාක්ෂණික කමිටුව කුමන කාරණාවක් නිසා හෝ පිළිගැනීම සුදුසු බවත් බුම්මලේ භූමිය සම්බන්ධව ගැටළු ඇති බවත් මෙහි ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් බව ආරංචි වූ බවත් ඒ නිසා ඉඩම නිවැරදිව නිරවුල් කරගෙන සොයා බලා මුදල් වෙන් කිරිමට ප්‍රථම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් නිවැරදි තීරණයකට ආ යුතු බව බව සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අපි යෝජනා ඉදිරිපත් කලේ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට බවත් ඒ සඳහා කවුරුන්වත් විරුද්ධ නොවූ බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී* අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය ඵල කරන ලදි.

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (4)

5(1.4) 2022 වෂර්ය සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව,නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුව, තාක්ෂණික සේවා(කමර්ාන්ත) කමිටුව,පරිසර හා පහසුකම් කමිටුව යන කමිටු පත්කිරිම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

වසරක් පාසා ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක වන කමිටු හතර පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

තවද මෙම කමිටු හතර සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ ආකාරයටම ක්‍රියාත්මක වීම සුදුසු බවත් කමිටු වලට නම ඇතුළත් නොවූ ගරු චාමික රුවන් දසනායක මන්ත්‍රීතුමාගේ නම සුදුසු කමිටුවක් වෙත ඇතුළත් කරන ලෙසත් ක්‍රියාත්මක කමිටු 4 සඳහා පැවැත්වෙන රැස්වීම් වාර වලින් අඩුම තරමින් 2/3 කටවත් පැමිණිය යුතු බවත් හැකියාවක් ඇත්නම් රැස්වීම් වාර සියල්ලටම සහභාගී වන ලෙස ඉල්ලීමක් කරන බවත් කමිටු ක්‍රියාත්මක වීම පිණිස සහයෝගය ලබාදෙන ලෙසත් ක්‍රියාත්මක කමිටු සියල්ලම පෙර පැවතුන ආකාරයටම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

***ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා***

හිටපු කමිටු ඒ ලෙසටම ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් නම් ඉදිරිපත් කර නොමැති ගරු මන්ත්‍රීවරුන් කමිටු සඳහා යොමු කරන ලෙසත් කමිටු වාර සියල්ලටම සහභාගී වන ලෙසත් එසේ නොමැති නම් අඩුම තරමින් කමිටු වාර 2/3 කටවත් පැමිණ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ක්‍රියාත්මක කමිටුම පත් කිරීම ගැන තමා සතුටු වන බවත් කෙසේ පත්කිරීම් සිදු කලත් සභාවේ සිටින ගරු මන්ත්‍රී මණ්ඩලයේ 43 දෙනාම සියළු කමිටු සඳහා පත් වන බවත් මන්ත්‍රීවරුන් සඳහන් කල පරිදි තමාද ඉතා ගෞරවණීය ඉල්ලීමක් සිදු කරන බවත් වසර තුළ පවත්නා කමිටු වාර 12න් 6කටවත් පැමිණෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

පරිසර කමිටුව වසරකට තුන් වරක් පමණ පැවැත්වෙන බවත් මෙහිදි එම කමිටුවේ සිටින මන්ත්‍රීවරු අසාධාරණයට ලක් වන බවත් එහිදි සාකච්ඡා කරන කටයුතු සිදු නොවන බවත් කමිටුව පැහැදිලිව තිබුනානම් අපට කථා කල හැකි බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගිය වසරේ කොරෝනා වසංගත තත්වය නිසා ගැටළු මතුවුන බවත් නමුත් මේ වසරේ කමිටු 04 ම සෑම මසකම පැවැත්වෙන බැවින් සියළු ෙදනා සහසාගී වන ලෙසත් ඉල්ලා සිටින ලදි.

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (5)

5(1.5) අංක 409,තුනදෙණිය එම්.ඩී.සුමනාවති මහත්මියට අයත් හිමිකම් අංක 0014760 මහනුවර කැ.සි. අංක 320096 හි කලාප අංක 02හි කැ.අ.86 හා 84 අතර පිහිටි ගම්සහා මාගර්ය ගැසට් පත්‍රයෙන් ඉවත් කිරිම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙම යෝජනාව පසුගිය සභාවට ඉදිරිපත් කර තිබූ බවත් ඒ අනුව සභාවේ කමිටුවක් හරහා ස්ථානීය පරික්ෂාවකට අපව යොමු කල බවත් මෙහිදි ප්‍රදේශය නියෝජනය කරන ගරු රත්නායක මන්ත්‍රීතුමා,ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා ගරු අගලවත්ත මන්ත්‍රීතුමා හා තමාද ඇතුළු කණ්ඩායම එම ස්ථානයට ගිය බවත් වසර 100ක් පමණ පැරණි අටබාගේ පාළම අසළ වෛද්‍ය ජානක සෝමරත්න මහතාගේ නිවසට යාබදව තිබූ මාගර්ය එතුමාගේ නිවස ඉදිරිපසින් ලබාදී ගරු අගලවත්ත මන්ත්‍රීතුමා සහ තමා එකතුව මෙවන් කටයුත්තක් ඉටු කල බවත් මිනිසුන්ගේ අවශ්‍යතා අපි විසදා දිය යුතු බවත් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට ගම්වල තිබෙන ප්‍රශ්න ඉදිරිපත් කරන බවත් සුමනාවති මහත්මිය කෙතරම් පීඩාවට පත්ව ඇතිද යන්න දුටු බවත් ෙමහි පාරක් අහලකවත් පේන්නවත් නොමැති බවත් ප්‍රදේශයේ ජනතාවද මාගර්යක් නොමැති බවට ඔප්පු කර පෙන්වූ බවත් එතුමියගේ පුත්‍රයාට නිවසක් සෑදීමට මෙම අය ඉල්ලීමක් කර තිබූ නිසාත් තමාද මෙම ස්තානය දුටුව නිසාත් අංක 409,තුනදෙණිය එම්.ඩී.සුමනාවති මහත්මියට අයත් හිමිකම් අංක 0014760 මහනුවර කැ.සි.අංක 320096 හි කලාප අංක 02හි කැ.අ.86 හා

84 අතර පිහිටි ගම්සහා මාගර්ය ගැසට් පත්‍රයෙන් ඉවත් කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මෙවන් කටයුත්තක් අටබාගේ ප්‍රදේශයේද වූ අතර විශාල ජනතාවක් පරිහරණය කල පාරක් වෙනත් ස්ථානයකින් සකස් කල බවත් මෙම මාගර්ය ජනතාව භාවිතා නොකරන බවත් මෙහි පාරක් නොමැති නිසාත් ගරු උප සභාපතිතුමා ගෙන ආ අදහස මම අනුමත කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමාට තනි තීරණයක් ගත නොහැකි බවත් සභාවේ කටයුතු සම්බන්ධව තීරණ ගැනීමට මහ සභාවට යොමු කල බවත් සදහන් කරන ලදි.

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (6)

5 (1.6) ආදේශක පුස්තකාල සහායිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් දීසර් කර ගැනීම යටතේ 2019.10.18 දින සිට 2021.12.31 දින දක්වා සේවය දීසර් කර දෙන ලෙසට හා 2022.01.01 දින සිට ඉදිරියට වසරක කාලයක් සදහා පුස්තකාල සහායිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් දීසර් කර ගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා

ආදේශක පුස්තකාල සහයිකාවන්ගේ සේවය අපට අත්‍යාවශ්‍යව ඇති මොහොතක යෝජනාවට අනුව 2019.10.18 දින සිට 2021.12.31 දින දක්වා සේවය දීසර් කර දෙන ලෙසට හා 2022.01.01 දින සිට ඉදිරියට වසරක කාලයක් සදහා පුස්තකාල සහායිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් දීසර් කර ගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

පුස්තකාල ක්ෂේත්‍රය අපට අත්‍යාවශ්‍යය අංශයක් බවත් අපේ දරුවන්ට දැනුම ලබා ගැනීමට ඇති ස්ථානයක් බවත් උඩපළාත ප්‍රාදේශීය සභාවේ පුස්තකාල වලට සේවකයින් අඩු බවත් එය අපට විශාල ගැටළුවක් බවත් පසුගිය දිනක තමා දොළුව පුස්තකාලය නිරීක්ෂණය කල බවත් එහිදී තරුණ පිරිස ඩිජිටල්කරණය යන කාරණාවේදී විශාල කැපකිරීමක් සිදු කරන බවත් තාක්ෂණික දැනුම අඩු යුගයක එම දරුවන් එම අයගේ හසළ දැනුම ලබාගෙන උඩපළාතේ පුස්තකාල 6ම ක්‍රියාත්මක කිරීම සදහා එම අයගේ සේවාව ලබාදුන් බවත් මේ දරුවන් මහන්සි වී වැඩ කලත් වේතන ගෙවීමේ ප්‍රශ්නයක් පැන නැඟී ඇති බවත් එය සභාවේ අපි සිදුකල අසාධාරණයක් ලෙස දකින බවත් ඒ නිසා පුස්තකාල ආදේශක පත්වීම් දෙක ස්ථාපනය කිරීම සදහා අපි ව්‍යාපෘති වාතර්ාවක් සකස් කල බවත් එය කොමසාරිස්තුමා වෙත යොමු කළාද නොදන්නා බවත් මෙවන් කටයුතු වලදී අපි නිළධාරියෙක් යවා හෝ එම කටයුතු කොමසාරිස්තුමා සමඟ කථා කල යුතු බවත් නැතිනම් එම දරුවන්ට අසාධාරණයක් වන බවත් එම දරුවන් වේදනාවෙන් හැඩූ බව තමාට දැනගන්නට ලැබුණු බවත් නමුත් අපි වැඩ අරගෙන හැඩීමට කටයුතු සැලැස්වීම නොකල යුතු බවත් සභාවේ යම් කිසි නිළධාරියෙක් යම් අයෙකුගෙන් කායර්ක් ඉටු කරගත්තා නම් ගෙවීම් ඉටු කිරීම සම්බන්ධයෙන් මීට වඩා සොයා බැලිය යුතු බවත් කම්කරු,ආදේශක කම්කරු,පුස්තකාල පමණක් නොව සියළු දෙනා ගැන සොයා බැලීම අපගේ වගකීමක් බවත් මේ අයගේ තිබෙන ප්‍රශ්න ගැන බැලිය යුතු බවත් අපට රියදුරන්ගේ ප්‍රශ්න ඇති බවත් සභාව අනුමත කර එවනවා නම් බදවා ගැනීම අනුමත කල හැකි බව කොමසාරිස්තුමා පැවසු බවත් දෛනික පදනම මත සේවකයින් බදවා ගැනිමට අනුමැතිය ලබා දෙන බව කොමසාරිස්තුමා පැවසූ බවත් ගම්පොල නගර සභාවේ සේවකයින් 20 දෙනෙකු ඩෙංගු පරීක්ෂාව සදහා කොමසාරිස්තුමාගේ අනුමැතියෙන් සේවයේ යොදවා ඇති බවත් අපටද එසේ කල හැකි බවත් ඒ නිසා

කම්කරු පත්වීමකට හෝ යොමු කර මෙම සේවකයින් දෙදෙනාගේ සේවය දීසර් කර ස්ථාපිත කරන ලෙස සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

දෛනික පදනම මත කිසිවෙකු බදවා නොගන්නා ලෙස කොමසාරිස්තුමා ලිඛිතව අපට දන්වා එවා ඇති බවත් ලේකම්තුමියට සහකාර කොමසාරිස්තුමිය හරහා අපට කම්කරු,සෞඛ්‍ය කම්කරු,මාගර් කම්කරු තනතුරු වල අය විශ්‍රාම යාම සහ මිය යාම හේතුවෙන් පවත්නා පුරප්පාඩු සදහා බදවා ගැනීමට අනුමැතිය ඉල්ලා සිටි බවත් එහිදි සහකාර කොමසාරිස්තුමිය ලේකම්තුමියට ලිඛිතව දන්වා එවා ඇත්තේ චක්‍රලේඛ නිවැරදිව කියවා බලා ඉල්ලීම් යොමු කරන ලෙසට බවත් ඒ නිසා අපි අපහසුතාවයට පත් වන බවත් අපි සියළු දේ ඉටු කල නමුත් දන්වා යැවූ නමුත් තවම නිවැරදි තීරණ නොමැති බවත් ඒ නිසා තමා නැවත කොමසාරිස්තුමා හමුවීමට ගිය බවත් එහිදි එතුමා මහ සභා තීරණයක් ලබා ගෙන යොමු කරන ලෙස සදහන් කල බවත් මෙයට පෙරද ඔබතුමාලා යෝජනා කර දෛනික පදනම මත බදවා ගැනීමට කටයුතු කරන ලෙස පැවසුවත් කායර් සාධක බලකායේ බදවා ගැනීම් නිසා බදවා ගැනීම සදහා අවස්ථාව නොදුන් බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>**හදිසි යෝජනා**</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (7)</u>

5 (1.7) උඩපළාත ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුව පවතින සෞඛ්‍ය කම්කරු තනතුරු හා මාගර් කම්කරු තනතුරු හා ආදාහනාගාර සහයක තනතුරු සදහා දෛනික වැටුප් මත සේවකයින් බදවා ගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**</u>

දැනට වසර 04ක පමණ කාලයක් ගල වුවත් කිසිම මන්ත්‍රීවරයෙකුට ගමට නිසි ලෙස වැඩ කටයුත්තක් සිදු කරගැනීමට නොහැකි වී ඇත්තේ මෙම කම්කරුවන්ගේ පුරප්පාඩු නිසා බවත් ඒ නිසා උඩපළාතේ මන්ත්‍රීවරු ලෙස අපි යම් කිසි දෙයක් සිදුකල බව කිව නොහැකි බවත් ගමේ පාරක් පවිත්‍ර කරගැනීමට වීජී ලාම්පුවක් සවිකරගැනීමට පවා අවස්ථාව නොලැබෙන බවත් ඒ නිසා ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාවට අනුව පුරප්පාඩු පවතින තනතුළුරු සදහා සේවකයින් බදවා ගෙන ඉදිරියේදි කටයුතු කරමු යැයි මම යෝජනා කරමි.

<u>**ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

සේවකයින් නොමැතිකම නිසා අපි ලොකු ගැටළුවක සිටින බවත් ඒ නිසා මහ සභා තීරණය අනුව කටයුතු කරන බව සදහන් කරන ලදි.

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**කමර්ාන්ත යෝජනා**

**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**

5 (2.1)පාරදෙක කඩවීදියේ පිහිටි පැරණි ආයුවෙර්ද ගොනැගිල්ල අළුත්වැඩියා කිරීම රු.400,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.2)කිරිමැටිය අගුරුමුල්ල මාගර්ය සංවධර්නය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.3)ගොනටුවල කොස්වැටිය මාගර්ය සංවධර්නය කිරීම රු.350,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු චාමික රුවන් දසනායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.4)වාඩිවත්ත පොදු ක්‍රීඩාංගණය පුළුල් කර පස් කපා ඉවත් කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.5)පුස්සැල්ලාව ගම ශ්‍රී බෝධිරාජාරාමයට ඉහළින් ඇති ගම් සභා මාගර්යේ ආරක්ෂිත බැම්ම ඉදිකිරීම රු.50,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.6) පුස්සැල්ලාව ගම ප්‍රධාන මාගර්යේ සිට කොස්ගොල්ල හා රයිලන්ඩ් වත්ත පාළම දක්වා මාගර්ය පස් කපා ඉවත් කිරීම රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.7)මෙල්ෆටර් වතුයායේ රම්බණ්ඩා මහතාගේ නිවස දෙසට දිවෙන මාගර්යේ ඉතිරි කොටස සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සුභද්‍රා සමරනායක මන්ත්‍රීතුමියගේ යෝජනා**

5 (2.8)හපුගස්පිටිය සුනේත්‍රා මහත්මියගේ නිවස අසළින් ඉහළට යන මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.9) හපුගස්පිටිය සඳසිරිවත්ත දැනට අබලන්ව ඇති ළිඳ සංවධර්නය කිරීම රු.50,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.10) හපුගස්පිටිය යකඩාදෙනිය මාගර්යේ ශාන්ත විජේරත්න මහතාගේ නිවස අසල සිට W.G සුමනාවතී මහත්මියගේ නිවස අසලින් යන මාගර්ය සංවධර්නය කිරීම රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමියගේ යෝජනා**

5 (2.11)නිල්ලඹ රබවර්ත්ත උඩකොටස මාගර්ය සංවධර්නය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.12)නිල්ලඹ ගොවිසෙවණ අසලින් දිවෙන මාගර්යේ නිල්ලඹ උඩ කොටසට දිවෙන අතුරු මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.13)නිල්ලඹ ආනන්දාරාමය අසලින් වායර්ගල දක්වා දිවෙන මාගර්යේ මහකැලේ උඩකොටස දක්වා දිවෙන අතුරු මාගර්යේ බෝක්කුව සංවධර්නය කිරීම රු.50,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.14) වාරියගල හිල්සයිඩ් ජල ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කුමාරවේළු කනගරත්නම් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.15)නයාපානවත්ත බාලචන්ද්‍රන් මහතාගේ නිවස අසලින් ක්‍රීඩා පිටියට යන මාගර්ය සංවධර්නය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.16)සෙල්වකන්ද ආමිනිගම මාගර්ය සංවධර්නය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.17) සෙල්වකන්ද වත්ත ක්‍රීඩා පිටිය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.18)නයාපාන උඩකොටස ප්‍රජාශාලාව සංවධර්නය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතාගේ යෝජනා

5 (2.19) ගල්පිහිල්ල වැව අසලින් යන මාගර්ය සංවධර්නය කිරීම රු.550,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු වත්සලා සේනානායක මන්ත්‍රීතුමියගේ යෝජනා

5 (2.20)ඉඟුරුවත්ත ගල්වල අසලින් යන අතුරු මාගර්ය සංවධර්නය කිරීම රු.250,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.21)ගල්පිහිල්ල අතුරු මාගර්ය සංවධර්නය කිරීම රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ඩබ්.ප්‍රේමතිලක මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.22)හිල්සයිඩ් ජල යෝජනා ක්‍රමයේ දෙවන අධියර ක්‍රියාත්මක කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.23) වනහපුව ජනපද ප්‍රේමාවතී මියගේ නිවස අසල සිට නෙල්ලි ගහ දක්වා මාගර්ය සංවධර්නය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.24) වත්තහේන පුපුරුස්ස පාරේ සිට දේවිකා මියගේ නිවස අසලින් ගමට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි

5 (2.25)අමුනුපුර හන්දියේ සිට දේවාලය අසලින් ගමට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි

5 (2.26) පුස්සැල්ලාව බ්ලැක්ෆොරස්ට් ජන පද පාරේ බෝක්කුව ඉදිකිරීම සඳහා රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි

ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.27)සැලුන් හන්දියේ මුස්නි මහතාගේ නිවසින් පිටුපස නාන තොටුපල සහ මාගර්ය සංවධර්නය කිරීම රු.250,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.28)ජුම්මා පල්ලිය අසග පාරුක් මහතාගේ නිවස අසලින් යන මාගර්ය සංවධර්නය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.29)කන්දේ මාගර්යේ සිට ඉසරාත් මහතාගේ නිවස අසලින් යන කාණුව ප්‍රධාන මාගර්යට සම්බන්ධ වන කොටස සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.30)ගම්පොල වත්ත සුසාන භූමිය හරහා ආඩියාකඩවතට යන පාර සංවර්ධනය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.31) ගම්පොල වත්ත ඉහල කොටසේ අතුරු මාගර්ය සංවර්ධනය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.32) අටුවේ වත්ත බණ්ඩාවත්ත ප්‍රදේශයට යන පොදු පාර සංවර්ධනය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.33) ගම්පොල වත්ත සේවා පියසට පහලින් වම් පැත්තට යන පාර සංවර්ධනය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.34) ලෙවලන් වත්ත ජන උදාන ගම්මාන මාගර්ය සංවර්ධනය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.35) මුල්ගම ඒරින් මාගර්යේ සිට කුඩා ගම්මාන මාගර්ය සංවර්ධනය කිරීම රු.200000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.36) දැල්පිටිය ග්‍රාම සේවා වසමේ ඇස්කොට් සුසාන භූමියට යන මාගර්ය සංවර්ධනය කිරීම රු.550000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ආර්,ඒම්,පී බණ්ඩාර මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.37)පාර පහ හන්දියේ සිට නො-04 ජනපදය දෙසට ඇති අබලන් වී ඇති මාගර්ය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු.550000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු මනෝජ් තිලකරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.38) කළුගල්හින්න වසමේ පිලිවෙල ප්‍රධාන පාරේ සිට ගාමිණී මහතාගේ නිවස අසලින් ආර්,ජී, විජේරත්න මහතාගේ නිවස දක්වා දිවෙන අතුරු මාගර්ය සංවර්ධනය කිරීම රු.550000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු නීල් සුගත් කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.39)ඉල්ලත්තමඩ සිඩ්හිල් මාගර්ය සංවර්ධනය කිරීම රු.200000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.40) වනහපුව අක්කරමලේ මාගර්ය සංවර්ධනය කිරීම රු.350000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමාගේ යෝජනා**

5(2.41) සොගමා වත්ත ජන උදාන මාගර්යේ රවී මහතාගේ නිවස අසලින් දිවෙන මාගර්ය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම රු.200000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.42) සොගමා වත්තජී.සී කොටසේ ප්‍රධාන පාරේ සිට ජී.සීකොටස දක්වා මාගර්ය කැපීම සඳහා රු.150000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.43)වහුගපිටිය පල්ලිය අසල අන්සාර් මහතාගේ නිවස අසල ඇති කානුව සඳහා බෝක්කුවක් ඉදිකිරීම සඳහා රු.200000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.44)මොරහේන ඉහල W,G නිශ්ශංක මහතාගේ නිවස අසල පාරට අවහිර ගල කඩා මාගර්ය කොන්ක්‍රීට් කිරීම සදහා රු.300000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.45)තුම්පැලවක ඒගොඩගම G,Gධමර්පාල මහතාගේ නිවස අසලින් ඉහලට ඇති මාගර්යේ පඩිපෙල බැදීම සදහා රු.250000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.46)නව හුනුගල ගම මැද මාගර්ය කොන්ක්‍රීට් කිරීම සදහා රු.400000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.47)උඩු දෙනිය රණවිරු ස්මාරකයට යන මාගර්ය කොන්ක්‍රීට් කිරීම සදහා රු.150000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.48)වජ්ලි වතුයායේ 4 වෙනි ලයිම් පේලියට යන මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.250000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.49) වජ්ලි වතුයායේ 6 වෙනි ලයිම් පේලියට යන මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.300000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු w.D.G ගුණතිලක මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.50)දුනුකේ උල්ල මාගර්යේ සිට බාස්රොක්වත්ත දක්වා මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.51)කළවැල්ගොල්ල පිහිල්ල අසලින් වැටී ඇති මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.200000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.52)මිල්ලගස්පිටිය සුසානභූමිය හරහා මීහිටිපොල දක්වා මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.53)වැරැල්ලපිටිය මාගර්යේ කාණු පද්ධතිය සංවධර්නය කිරීම සදහා රු.150000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කෝකිලා වරාහේන මන්ත්‍රීතුමියගේ යෝජනා

5(2.54)නයාපාන ජනපදයේ පිට්ටනිය අසලින් ගම මැද මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.450000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.55)ගලත ගම මැද මාගර්යේ දිවෙල කොටසෙහි මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමියගේ යෝජනා

5(2.56)පරන හල්ඔය පුංචිවත්ත කොටසේ ඇල මාගර්යෙන් ඒගොඩ මෙගොඩ යාම සදහා පාලමක් දමා සංවධර්නය කිරීම සදහා රු.550.000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සමන්ත කුමාර ආරියදාස මන්ත්‍රීතුමාගේ යෝජනා

5(2.57)උඩගම මාළිගාතැන්න නීලවීර මහතාගේ නිවස අසල මාගර්ය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.300000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.58)උඩගම මැදගම්මැද්ද සමන්ත මහතාගේ නිවස අසල මාගර්ය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.100000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5(2.59)ඉහළගම කොටුව හරහා විජේසිංහ මහතාගේ වෙළඳසැල දක්වා මාගර්ය පුළුල් කිරීම සඳහා රු.150000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු  කීතර්‍ී රත්නායක මන්ත්‍රීතුමා</u>

ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය එල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**<u>(6) කාරක සභා වාථර්ා ඉදිරිපත් කිරීම</u>**

1.2022.01.12 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

2.2021.12.30 දිනැති නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාථර්ාව  ඉදිරිපත් කිරීම.

3.2021.12.16  දිනැති කඩ කාමර  ටෙන්ඩර් කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

ඉදිරිපත් කර ඇති සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කිතර්‍ී රත්නායක මන්ත්‍රීතුමා</u>**

සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**(7) ආදායම් වියදම් වාථර්ා  ඉදිරිපත් කිරීම**  -2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාථර්ාව හා  ආදායම් ප්‍රගති වාථර්ාව සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාථර්ාව හා  ආදායම් ප්‍රගති වාථර්ාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>*

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාථර්ාව හා  ආදායම් ප්‍රගති වාථර්ාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින සභාවට නොපැමිණි ගරු ***මන්ත්‍රීතුමන්***ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

***ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා***

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට මම යෝජනා කරමි

**ගරු මුරාඩ් මන්ත්‍රීතුමා**

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

**(8) වෙනත්**

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරි මහ සභා දිනය පවත්නා තත්වය මත තීරණය කරන බව සඳහන් කරන ලදි.

**(10) මහ සභාව අවසන් කිරීම**

**(10) මහ සභාව අවසන් කිරීම**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින එනම් 2021 වෂර්යේ අවසන් මහ සභා වාරය සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තුතිවන්ත වන අතර යම් යම් දේවල් වලට අපි ගැටුම් ඇති කර ගත්තත් අපි සභාවෙන් පිටතදී සහෝදරත්වයෙන් කටයුතු කරන බවත් වසර 3 ½ පමණ කාලයක් ගෙවී අවසන් වි ඇති බවත් සඳහන් කරමින් ලබන්නා වූ 2022 වෂර්ය සුභදායි වසරක් වේවායි සියළු දෙනාට ප්‍රාථර්නා කරන අතර අපට කල නොහැකි වූ කාරණා සම්බන්ධයෙන් 2022 වසරේ ඉතා හොඳින් කටයුතු කිරිමට ගරු මන්ත්‍රී මණ්ඩලයත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයත් අධිෂ්ඨාන කරගමු යැයි සඳහන් කරමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාථර්නා කරමින් ප.ව.12.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

| | |
|---|---|
| ලේකම් | සභාපති |
| උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව |